එතෙර මෙතෙර ඇය

# පුංචි ශ්‍රී ලංකාවට - ආදරය කරන ඉන්දීය විදේශ ලේකම් නිරූපමා මෙනන් රාඕ





නිරූපමා මෙනන් රාඕ මහත්මිය 2004 වර්ෂයේ දී ඉන්දියානු තානාපතිනිය වශයෙන් අපේ රටට පැමිණියාය. ඒ නිසාම ඇය අපට අමුත්තියක් ද නොවන්නීය. අසල්වැසි නිවෙස් දෙකක පැවැත්විය යුතු සුහද මිතුදම දෙරටේ ගොඩ නැංවීමට ඇය ක්‍රියා කළේ සංස්කෘතික බැඳියාවද ඉවහල් කර ගනිමිනි.

තානාපති ධූරයෙන් සමුගෙන මව්බිම බලා ගිය ද මිතු දමක් වෙනස් වෙන්නේ කෙසේද? තත්ත්වයෙන් කෙතරම් ඉහළට ගිය ද සැබෑ මිත්‍රත්වය නොවෙනස්වේ. අද නිරූපමා මෙනන් රාඕ ඉන්දියාවේ විදේශ ලේකම්වරියයි. ඇයට එම පත්වීම ලැබුණේ පසුගිය වසරේ ජූලි මාසයේදීය.



මෑතකදී නිරූපමා රාඕ ලංකාවට පැමිණියේ දෙරටේ මිතුදම වඩාත් සවිමත් කිරීමටය. ඉන්දියානු විදෙස් සේවයේ මුල් පුටුව වන ලේකම් ධූරයට පත් දෙවෙනි කාන්තාව ඇයයි.

විදේශ ලේකම් වරිය වීමට පෙර එරටේ තනතුරු ගණනාවක්ම හොබවමින් නිරූපමා අත්දැකීම් සම්භාරයක් ලැබුවාය.

වොෂින්ටන් මාධ්‍ය කටයුතු පිළිබඳ ඉන්දියානු ඇමති, මොස්කව් තානාපති කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන තානාපති ධූරය ඉන් ප්‍රමුඛස්ථානය ගනී. ඇය නැගෙනහිර ආසියාවේ සම්බන්ධීකරණ ලේකම් වශයෙන් කටයුතු කළේ ඉන්දිය බාහිර විදේශ කටයුතු පිළිබඳ පළමු කතානායිකාව බවට පත් වෙමිනි.

ශ්‍රී ලංකාවට අමතරව ඇය පේරූ රටේ හා චීනයේ තානාපතිවරිය වශයෙන් ද කටයුතු කර තිබේ. නිරූපමා කේරලයේ මාලාපුරම් හි උපන්නියකි. ඇයගේ පියා හමුදා නිලධාරියකු වූ නිසා ඇයට පාසල් ගණනාවකින්ම අධ්‍යාපනය ලැබීමට සිදුවිය. බැංගලෝර්, පූනේ, ලක්නව්, කුනෝර් (තමිල්නාඩු) ආදී පාසැල් ඒ අතර විය. ඇය ඉංග්‍රීසි බසින් උපාධිය ලැබුවේ බැංගලෝරයේ මවුන්ට් කාමල් කොලීජියෙනි. පසුව ඇය ඉංග්‍රීසි සාහිත්‍ය පිළිබඳ පශ්චාත් උපාධිය මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ මරත්වාඩා සරසවියෙන් ලබා ගත්තාය.

1973 වසරේ පැවති රාජ්‍ය පරිපාලන විභාගයෙන් ප්‍රථමස්ථානයට පත් නිරූපමා විදේශ කටයුතු අමාත්‍යාංශයට බැඳුණාය.